IHRA

UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය – ශ්‍රී ලංකාව

ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය – ▯ කොටස – පළමු සෙමෙස්තරය 2021

**(සිංහල මාධ්‍යය)** – On line Examination

(පවත්වන ලද්දේ 2021 සැප්තැම්බර්/ඔක්තෝබර්)

# නෛතික පරිසරය- BLM 1131

අයදුම්කරුවන්ට උපදෙස්

(01) ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

- අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීන්දු කෙරෙහි අවධානය යොමුකළ යුතු වේ.

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(03) කාලය පැය දෙකයි. (02)

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

1)

"රෝම, ඉංග්‍රීසි, සිංහල, හින්දු සහ මුස්ලිම් යන නීති පද්ධතීන්ගෙන් සැදුම් ලත් ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ ඇති සීමිත බවට වඩා එහි පවතින පෝෂිත බව නිසා එය අපහසුතාවයට පත් වී ඇත."

Sir Ivor Jennings and H.W. Tambiah, *The dominion of Ceylon: the development of its laws and Constitution* (Stevens 1952) P. 184

ඉහත ප්‍රකාශය සමග ඔබ එකග වන්නේද? ඔබේ පිළිතුර සනාථ කිරීම සඳහා අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීන්දු ගෙන හැර දක්වන්න.

**(ලකුණු 25)**

2)

**ඈ)** රෝම ලන්දේසි නීතියේ සම්භාව්‍ය මූලාශ්‍ර පිළිබඳව හැඳින්වීමක් කරන්න

**(ලකුණු 10)**

**ආ)** බතාවියානු ව්‍යවස්ථා (Batavian Statutes) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ රෝම ලන්දේසි නීතියේ මූලාශ්‍රයක් ලෙස භාවිතා කළ අයුරු පැහැදිලි කරන්න.

**(ලකුණු 15)**

**(මුළු ලකුණු 25)**

3)

'ඉංග්‍රීසි නීතිය ලංකාවට හඳුන්වා දීමේදී අධිකරණ ක්‍රියාකාරීත්වය සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළේය. කෙසේ වෙතත්, එලෙස ඉංග්‍රීසි නීතිය ඇතුළත් කිරීම සාධාරණීකරණය කිරීම සඳහා යොදාගත් ඇතැම් තර්ක සමහරක් අත්තනෝමතික විය'.

විනිශ්චිත නඩු තීන්දු ඇසුරෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න.

**(ලකුණු 25)**

4)

පහත අ) හෝ ආ) යන කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න

**අ)** "ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක මුස්ලිම් නීතිය දේශීය භාවිත හා චාරිත්‍ර වලින් සැදුම් ලද්දක් වන අතරම, එය තුළ සමස්ත ඉස්ලාමීය නීති දේහයම දැක ගැනීමට හැකියාවක් නැත".

L. J. M. Cooray, *An Introduction to the Legal System of Sri Lanka* (Stamford Lake 1972) P. 135

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟද? විනිශ්චිත නඩු තීන්දු ඇසුරෙන් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

**(ලකුණු 25)**

**හෝ**

**ආ)** තේසවලමේ නීතිය පෞද්ගලික නීතියක් ලෙස මෙන්ම ප්‍රාදේශීය නීතියක් ලෙසද ක්‍රියාත්මක වේ.

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟද? ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීන්දු ඇසුරෙන් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

**(ලකුණු 25)**

5)

***විලියම්ස් එ. රොබර්ට්සන්*** (1886) 8 SCC 36 ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව උඩරට නීතියේ දිශානතිය වෙනස් කරන ලදී. කෙසේ හෝ, මෙම තීරණය නිවැරදි නොවන බවට කරුණු රාශියක්ද ඉදිරිපත් කළ හැකි වේ.

ඉහත ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීරණය නිවැරදි නොවන බවට ඉදිරිපත් කළ හැකි කරුණු විවේචනාත්මකව විමසන්න.

**(ලකුණු 25)**

**6)**

අ) චාරිත්‍රයක් නීතියක් ලෙස පිළිගැනීමට ඔප්පුකළ යුතු අවශ්‍යතාවයන් සැකෙවින් විස්තර කරන්න.

**(ලකුණු12.5)**

ආ) අධිකරණ පූර්ව නිදර්ශන න්‍යාය පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

**(ලකුණු12.5)**

**(මුළු ලකුණු 25)**

***************************

IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව

ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - I කොටස - පළමු සෙමෙස්තරය 2021

**(සිංහල මාධ්‍යය)** — On line Examination

පවත්වන ලද්දේ 2021 සැප්තැම්බර් ඔක්තෝබර්

# කළමනාකරණ මූලධර්ම - BLM 1132

අයදුම්කරුවන්ට උපදෙස්

(01) ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(03) කාලය පැය දෙකයි. (02)

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහළින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න

01. අ. කළමනාකරණය සම්බන්ධ මූලික යෙදුම් (Key Terms) නිර්වචනය කරන්න

(ලකුණු 15)

ආ. කළමනාකරණ තීරණ ගැනීමේ ක්‍රියාවලිය උදාහරණයක් ආශ්‍රයෙන් විස්තර කරන්න

(ලකුණු 10)

(මුළු ලකුණු 25)

02. අ. ඔබ දන්නා ආයතනයක අරමුණු ප්‍රකාශනයක් (Mission Statement) ඉදිරිපත් කර ඒ පිළිබඳ කළමනාකරණ විශ්ලේෂණයක් ඉදිරිපත් කරන්න

(ලකුණු 10)

ආ. සදුඅත විශ්ලේෂණය (SWOT Analysis) හඳුන්වා, එහිදී සැලකිල්ලට ගන්නා අභ්‍යන්තර හා බාහිර සාධක විස්තර කරන්න

(ලකුණු 10)

ඇ. සමස්ථ උපායමාර්ග නිර්වචනය කර ශ්‍රී ලාංකික උදාහරණය බැගින් ඉදිරිපත් කරන්න

(ලකුණු 05)

(මුළු ලකුණු 25)

03. පහත සඳහන් මාතෘකා පිළිබඳ සටහන් ලියන්න

අ. විධිමත් සහ අවිධිමත් සංවිධාන (Formal and informal organizations)

ආ. සංවිධාන සටහන (Organization chart)

ඇ. සංවිධාන මූලධර්ම (Organizing principles)

ඈ. බලතල පැවරීම (Delegation)

ඉ. දෙපාර්තමේන්තුගත කිරීම (Departmentalization)

(ලකුණු 5 X 5= 25)

04. අ. ඵලදායක නායකයෙකු වියහැකි ආකරය නායකත්ව රාමුව (Leadership Grid/ Management Grid) ඇසුරෙන් පැහැදිලි කරන්න

(ලකුණු 10)

ආ. නායකයෙකුට වඩාත් වැදගත් වන්නේ තනතුරින් ලැබෙන බලයද නැත්නම් පුද්ගලික බලයද ? පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ඇ. 'අනුගාමිකයින්ගේ හැසිරීම, ඔවුන්ගේ සිතීමේ හැකියාව සහ ක්‍රියාකාරී ස්වභාවය මත තීරණය වේ. එකගවෙද?' පැහැදිලි කරන්න.

(ලකුණු 05)

**(මුළු ලකුණු 25)**

05. අ. ඔබ අධ්‍යයනය කර ඇති සේවක අභිප්‍රේරණ න්‍යායන් තුනක් විස්තර කරන්න

(ලකුණු 15)

ආ. ඔබ ආයතනයට අභිප්‍රේරණ ප්‍රතිපත්තියක් සැදීමේදී ඉහත න්‍යායන්ගෙන් ගතහැකි ප්‍රයෝජන පැහැදිලි කරන්න

(ලකුණු 10)

**(මුළු ලකුණු 25)**

*************************

IHRA

UNIVERSITY OF COLOMBO

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - I කොටස - පළමු සෙමෙස්තරය**

2021 **(සිංහල මාධ්‍යය) – On line Examination**

**(පවත්වන ලද්දේ 2021 සැප්තැම්බර්/ඔක්තෝබර්)**

**සංඛ්‍යානය - BLM 1133**

අයදුම්කරුවන්ට උපදෙස්

(01) ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න

- ගනකයන්ත්‍ර (Calculators) භාවිතා කළ හැක.
- ප්‍රස්ථාර කොළ ඔබ විසින් සපයා ගත යුතුය.

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් **(06)** සහ පිටු පහකින් **(05)** සමන්විත වේ.

(03) කාලය පැය දෙකයි. **(02)**

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටවුක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න

**1.**

අ) පහත දැක්වෙන ඒවා සඳහා කෙටි සටහන් ලියන්න.

i. විස්තරාත්මක සංඛ්‍යානය

ii. විශ්ලේෂණාත්මක සංඛ්‍යානය

(ලකුණු 25)

ආ) සුදුසු උදාහරණ දෙමින් පහත ඒවා කෙටියෙන් විස්තර කරන්න.

i. විවික්ත විචල්‍යය

ii. සන්තාරක විචල්‍යය

(ලකුණු 25)

ඇ) කෙටියෙන් විස්තර කරන්න.

i. ප්‍රාථමික දත්ත

ii. ද්විතික දත්ත

(ලකුණු 25)

ඈ) සුදුසු උදාහරණ දෙකක් ඇසුරෙන් නියැදියක් යනු කුමක්දැයි විස්තර කරන්න. (ලකුණු 25)

(මුළු ලකුණු 100)

**2.** ඔබ විසින් සපයාගෙන ඇති ප්‍රස්ථාර කොළ භාවිතා කර පහත ව්‍යාප්ති සඳහා ප්‍රස්ථාර අඳින්න.

අ) එක්තරා ආයතනයක වියදම් ඇසුරෙන් ගොඩනැගූ ව්‍යාප්තිය ඇසුරෙන් වට ප්‍රස්ථාරයක් අඳින්න.

| | මිල (රු මිලියන) |
|---|---|
| අමු ද්‍රව්‍ය | 1,689 |
| බදු | 582 |
| නිෂ්පාදනය | 543 |
| සේවකයන් සඳහා | 470 |
| වෙනත් වියදම් | 286 |

| | |
|---|---|
| ක්ෂයවීම | 94 |
| ලාභය | 75 |
| රඳවා ගත ආදායම් | 51 |
| එකතුව | 3,790 |

(ලකුණු 25)

ආ) පහත දැක්වෙන තොරතුරු භාවිතයෙන් ජාල රේඛයක් අඳින්න.

| බර (කි.ග්‍රෑම්) | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| 30 - 34 | 3 |
| 35 – 39 | 5 |
| 40 – 44 | 12 |
| 45 – 49 | 18 |
| 50 – 54 | 14 |
| 55 – 59 | 6 |
| 60 – 64 | 2 |

(ලකුණු 25)

ඇ) පහත දී ඇති දත්ත භාවිතා කර සමුච්චිත සංඛ්‍යාතය ඇසුරෙන් ඔගිවිය අඩු හා ඔගිවිය වැඩි වක්‍ර අඳින්න.

| ලකුණු | සංඛ්‍යාතය |
|---|---|
| 0 - 10 | 3 |
| 10 – 20 | 9 |
| 20 - 30 | 15 |
| 30 – 40 | 30 |
| 40 – 50 | 18 |
| 50 – 60 | 5 |

(ලකුණු 25)

ඈ) ඉහත "ඇ" ප්‍රස්ථාරය භාවිතයෙන් මධ්‍යස්තය සොයන්න. (ලකුණු 25)

(මුළු ලකුණු 100)

**3.** පනස් (50) දෙනෙකුගෙන් යුත් කම්කරුවන් කණ්ඩායමක් ඇසුරෙන් එක් එක් කම්කරුවාගේ ප්‍රතිදානයන් පහත වගුව මගින් ලබා දී ඇත.

| පන්ති ප්‍රාන්තර | සංඛ්‍යාතය |
|---|---|
| 70 - 74 | 3 |
| 75 – 79 | 5 |
| 80 – 84 | 16 |
| 85 – 89 | 12 |
| 90 – 94 | 6 |
| 95 – 99 | 6 |
| 100 -104 | 2 |

කම්කරුවන්ගේ ප්‍රතිදාන වල,

ආ) මාතය

ආ) මධ්‍යස්තය

ඇ) මධ්‍යනාශය

ඈ) සම්මත අපගමනය සොයන්න.

(ලකුණු 25 x 4 = 100)

**4.** පහත වගුව භාවිතා කර, A හා B ප්‍රදේශ වලදී කාල් පියසන්ගේ,

අ) මධ්‍යනාශය,මාතය හා සම්මත අපගමනය භාවිතයෙන් කුටිකතා සංගුණකය

(ලකුණු 30)

ආ) චතුර් ඵකතාවයේ කුටිකතා සංගුණකය යන ඒවා ගණනය කරන්න.

(ලකුණු 30)

ඇ) A හා B ප්‍රදේශ වල තොරතුරු වල හැසිරීම පිළිබඳව කුටිකතාවය ඇසුරෙන් සාකච්චා කරන්න.

(ලකුණු 40)

(මුළු ලකුණු 100)

| මිනුම් | A ප්‍රදේශය | B ප්‍රදේශය |
|---|---|---|
| මධ්‍යනාසය | 256.5 | 240.8 |
| මධ්‍යස්ථය | 201.0 | 201.6 |
| සම්මත අපගමනය | 215.4 | 181.1 |
| පළමු චතුතර්කය | 260.0 | 242.0 |
| තෙවන චතුතර්කය | 157.0 | 164.2 |

**5.** පහත වගුවේ දී ඇති දත්ත සඳහා

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| X | 10 | 12 | 13 | 16 | 17 | 20 | 25 |
| Y | 10 | 22 | 24 | 27 | 29 | 33 | 37 |

අ) ප්‍රස්ථාරයක් මත විසිරි තිත් සටහනක් ඇද මෙම තොරතුරු වල ස්වභාවය විස්තර කරන්න.

(ලකුණු 30)

ආ) දත්ත ඇසුරෙන් සුදුසුම අනුසියුම් රේඛාවෙ සමීකරණය ලබා ගන්න.

(ලකුණු 30)

ඇ) ඉහත වගුව ඇසුරෙන් කාල් පියසන්ගේ සහ සම්භාවිතා සංගුණකය සොයන්න.

(ලකුණු 40)

(මුළු ලකුණු 100)

6. කර්මාන්ත ශාලාවක සේවාමුර තුනකදී නිෂ්පාදනය කරන නිෂ්පාදන වල තත්වය පරීක්ෂා කර හොඳ සහ නරක ඒවා ලෙස නම් කර පහත වගුවේ දී ඇත.

| සේවා මුරය | හොඳ | නරක | එකතුව |
|---|---:|---:|---:|
| උදය | 900 | 130 | 1,030 |
| හවස | 700 | 170 | 870 |
| රාත්‍රී | 400 | 200 | 600 |
| එකතුව | 2,000 | 500 | 2,500 |

5% ක වෙසෙසියා මට්ටමක් සැලකීමේදී වැඩමුරය හා නිෂ්පාදන වල තත්වය අතර සම්බන්ධතාවයක් පවතින්නේද යන්න පරීක්ෂා කරන්න.

(ලකුණු 100)

************************

IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - I කොටස - පළමු සෙමෙස්තරය 2021

(සිංහල මාධ්‍යය) — On line Examination

(පවත්වන ලද්දේ 2021 සැප්තැම්බර්/ඔක්තෝබර්)

# ලේඛකත්වය හා සන්නිවේදනය - BLM 1134

අයදුම්කරුවන්ට උපදෙස්

(01) එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න 02ක් වත් තෝරා ගෙන ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(03) කාලය පැය දෙකයි. (02)

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

## 1 කොටස

1. සන්නිවේදන ක්‍රියාවලියක මූලිකාංග ඇසුරින් ' සන්නිවේදනය' යන සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 15)

2. මානව සන්නිවේදනයේ සංවර්ධනය හා මානව ශිෂ්ටාචාරයේ වර්ධනය අතර ඇති සම්බන්ධය මානව සන්නිවේදන යුග ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

3. " ගුවන් විදුලි බස කථනයට සමීප විය යුතු ය". සිංහල භාෂාව ඇසුරින් විමසන්න.

(ලකුණු 15)

4. පුවත්පත් බස් වහරේ දැකිය හැකි ලේඛන ප්‍රභේද දක්වා එයින් එක් ප්‍රභේදයක් පිළිබඳ විස්තරාත්මක සටහනක් ලියන්න.

(ලකුණු 15)

## II කොටස

5. "සන්නිවේදන අවශ්‍යතා අනුව සිංහල හෝඩිය ද කාලයත් සමග වෙනස් වී ඇත". නිදසුන් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

6. භාෂා ද්විරූපතාව හා සන්නිවේදනය අතර ඇති සම්බන්ධය සිංහල භාෂාව ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

7. 'අක්ෂර වින්‍යාසය' යනු කුමක්දැයි පැහැදිලි කොට සිංහල අක්ෂර වින්‍යාසයේ 'පොදු වැරදි' 10ක් දක්වා ඒවායේ නිවැරදි ප්‍රයෝග දක්වන්න.

(ලකුණු 15)

8. ශාස්ත්‍රීය ලේඛනයක ලක්ෂණ විභාග කොට ශාස්ත්‍රීය ලේඛනයක මූලාශ්‍රය දැක්විය යුත්තේ ඇයි දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 15)

****************

IHRA
UNIVERSITY OF COLOMBO

## මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - I කොටස - පළමු සෙමෙස්තරය 2021

**(සිංහල මාධ්‍යය) — Online Examination**

**(පවත්වන ලද්දේ 2021 සැප්තැම්බර්/ඔක්තෝබර්)**

# මූල්‍ය ගිණුම්කරණය - BLM 1135

අයදුම්කරුවන්ට උපදෙස්

(01) පළමු (01) ප්‍රශ්නය ඇතුළුව ඕනෑම ප්‍රශ්න (04) කට පිළිතුරු සපයන්න.

- ගණක යන්ත්‍ර භාවිතා කළ හැක.

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු නමයකින් (09) සමන්විත වේ.

(03) කාලය පැය දෙකයි (02).

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

**01.** සුහර්ශන ට්‍රේඩර්ස් යනු, සුහර්ශන මහතාට අයත් තනි පුද්ගල ව්‍යාපාරයකි. 2021 මාර්තු 31 දිනට, සුහර්ශන ට්‍රේඩර්ස් හි ශේෂ පිරික්සුම පහත දැක්වේ.

සුහර්ශන ට්‍රේඩර්ස්

2021 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම

| ගිණුමේ නම | හර (රු. '000) | බැර (රු. '000) |
|---|---|---|
| විකුණුම් | | 1,200 |
| ගැනුම් | 420 | |
| 2020.04.01 දිනට තොගය | 80 | |
| ඉඩම (පිරිවැයට) | 300 | |
| ගොඩනැගිලි (පිරිවැයට) | 700 | |
| මෝටර් රථ (පිරිවැයට) | 600 | |
| 2020.04.01 දිනට ගොඩනැගිලි සමුච්චිත ක්ෂය | | 210 |
| 2020.04.01 දිනට මෝටර් රථ සමුච්චිත ක්ෂය | | 180 |
| 2020.04.01 දිනට හිමිකම | | 357 |
| කුලී ආදායම | | 32 |
| වැටුප් හා වේතන | 108 | |
| ප්‍රවර්ධන වියදම් | 65 | |
| විදුලිය | 40 | |
| විකුණුම් කොමිස් | 25 | |
| ලද වට්ටම් | | 8 |
| දුන් වට්ටම් | 6 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 250 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 190 |
| 10% බැංකු ණය | | 500 |
| බැංකුවේ ඇති මුදල් | 83 | |
| **මුළු එකතුව** | **2,677** | **2,677** |

අතිරේක තොරතුරු

- 2021 මාර්තු 31 දිනට තොගය (පිරිවැයට) රු. 50,000 කි.
- ගිණුම් කාලච්ඡේදය තුලදී රු. 15,000 ක් පිරිවැය වූ තොග හානි වී ඇත. කෙසේ වෙතත්, එම වටිනාකමින් 60% ක් සඳහා වන්දි ගෙවීමට රක්ෂණ සමාගම එකග වී ඇත.
- සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා සේවක දායකය 10% ක් වන අතර සේවා‍ය දායකය 15% ක් වේ. සේවක භාර අරමුදල් දායකය (ETF) 3% ක් වේ. EPF සේවක දායකත්වය අඩුකර වැටුප් ගෙවා ඇත. EPF හා ETF සම්බන්ධයෙන් වෙනත් ගැලපීම් සිදුකර නොමැත.
- 2021 මාර්තු මාසය සඳහා ගෙවියයුතු විදුලිය රු. 10,000 ගිණුම් පොත් වල වාර්තා කර නොමැත.
- 2021 මාර්තු 31 දිනට ඉදිරියට ගෙවන ලද ප්‍රවර්ධන වියදම් රු.15,000 කි.
- 2021 මාර්තු 31 දිනට පවතින ණයගැති ශේෂයෙන් රු. 20,000 ක් බෝල් ණය ලෙස කපහළ යුතු අතර, ඉතිරි ණයගතියන්ගෙන් 10% ක් අඩමාන ණය ලෙස වෙන් කළ යුතුය.
- සරල මාර්ග ක්‍රමය මත ක්ෂය ප්‍රතිශතයක් පහත පරිදි වේ.

  ගොඩනැගිලි : වාර්ෂිකව 5%

  මෝටර් රථ : වාර්ෂිකව 10%

ඔබ විසින් පහත දෑ පිළියෙළ කල යුතුය:

(i) 2021 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය.

(ලකුණු 12)

(ii) 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.

(ලකුණු 13)

**(මුළු ලකුණු 25)**

**02.**

(i) "ගිණුම්කරණ තොරතුරු ලබාගන්නා බාහිර පරිශීලකයන් අතර මූල්‍ය ගිණුම්කරණය අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි". ඔබ මෙම ප්‍රකාශය සමග එකග වන්නේද.? උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ii) විගණකවරු විසින් සීමිත මනෝහර පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශ වලින් පහත තොරතුරු අනාවරණය කරගෙන ඇත. එම එක් එක් තත්වයන් සඳහා ඔබ එකග වනවාද? නැතිද? යන්න සඳහන් කර, ඊට අදාළ ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

a . තොග අගය කිරීම සඳහා සමාගම අඛන්ඩව එකම ක්‍රමය අනුගමනය කර ඇත.

b . අවසාන මාසය සඳහා ලැබුණු දුරකථන බිල්පත සඳහා ගෙවීම නොකළ හෙයින්, එය ගිණුම් ගත කර නොමැත.

c . විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත ගනුදෙනුකරුවන් සඳහා යවන ලද භාණ්ඩ ණයට විකුණුම් ලෙස සඳහන් කර ඇත.

d . සමාගමට නෛතික අයිතියක් නොමැති හෙයින්, කල්බදු මගින් අත්පත් කරගත් මෝටර් රථය වත්කම යටතේ දක්වා නොමැත.

(ලකුණු 08)

(iii) මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව වත්කමක ලක්ෂණ තුනක් (03) හඳුනා ගන්න.

(ලකුණු 03)

(iv ) මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව පහත දැක්වෙන, මූල්‍ය ගිණුම්කරණ තොරතුරු වැඩිදියුණු කිරීමේ ගුණාත්මක ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න.

a . සංසන්දනාත්මක බව

b . සත්‍යාපනය කල හැකි බව

(ලකුණු 04)

(v) වර්තමානයේ බොහෝ ව්‍යාපාර සංවිධාන පරිගණක පදනම කරගත් ගිණුම්කරණය භාවිතා කරයි. ව්‍යාපාර ආයතනක් සඳහා පරිගණක පදනම කරගත් ගිණුම්කරණයේ වාසි හා අවාසි දෙක (02) බැගින් හඳුනා ගන්න.

(ලකුණු 04)

**(මුළු ලකුණු 25)**

## 03.

(i) නිසල් මහතා 2021 අප්‍රේල් 01 දින කිරි නිෂ්පාදන විකිණීමෙ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ව්‍යාපාරයේ පළමු මාසය තුළ සිදුවූ ගනුදෙනු වල බලපෑම පහත ගිණුම්කරණ සමීකරණය යටතේ දක්වා ඇත.

(රු. '000)

| ගනුදෙනු අංකය | වත්කම = | | | | | හිමිකම | + වගකීම | |
|---|---|---|---|---|---|---|---|---|
| | මෝටර් රථ | යන්ත්‍ර | තොග | ණයගැතියෝ | මුදල් | හිමිකම | බැංකු ණය | ණයහිමියෝ |
| 01. | +1,200 | +200 | | | +100 | +1,400 | +100 | |
| 02. | | | +160 | | | | | +160 |
| 03. | | | -35 | | +50 | +15 | | |
| 04. | | | +40 | | -40 | | | |
| 05. | | | | | +500 | +500 | | |
| 06. | | | -100 | +130 | | +30 | | |
| 07. | | | | | -135 | +5 | | -140 |
| 08. | | | | | -8 | -8 | | |
| 09. | | | | | -20 | -2 | -18 | |
| 10. | | | | | -14 | -14 | | |
| 11. | | | | -130 | +127 | -3 | | |
| 12. | -10 | -2 | | | | -12 | | |

<u>අතිරේක තොරතුරු</u>

- හිමිකම වෙනස් වීමට බලපා ඇති ගනුදෙනු අංක 01, 05, සහ 10 ලාභය සඳහා බල නොපායි.
- මෝටර් රථ සහ යන්ත්‍ර වාර්ෂිකව පිළිවෙලින් 10% සහ 12% බැගින් ක්ෂය කරනු ලබයි.

අවශ්‍ය වන්නේ:

a . ඉහත 01 සිට 12 තෙක් එකිනෙක ගනුදෙනුව විස්තර කරන්න.

(ලකුණු 12)

b . අප්‍රේල් මාසය සඳහා ව්‍යාපාරයේ ලාභය හෝ පාඩුව ගණනය කරන්න.

(ලකුණු 04)

(ii) 2021 ජුනි 30 දිනට දිනුක එන්ටර්ප්‍රයිසස් හි මුදල් පාලන ගිණුමේ බැර ශේෂය රු. 32,600 ක් විය. කෙසේ වෙතත් එදිනට බැංකු ප්‍රකාශය රු. 50,300 ක අයිරාවක් පෙන්විය.

දිනුක එන්ටර්ප්‍රයිසස් හි ගණකාධිකාරිවරයා ඉහත වෙනස සඳහා පහත හේතු අනාවරණය කර ගන්නා ලදී.

- රු. 12,500 ක් වූ තැන්පත්කළ චෙක්පත (අංක: 435634) උපලබ්ධි වී නොතිබිණ.
- ණයගැතියන් විසින් රු. 4,500 ක මුදලක් සෘජුවම බැංකුවට ඒවා තිබුණි.
- තැන්පත් කළ අගරු වූ චෙක්පත් රු. 6,000 ක් විය.
- රු. 7,800 ක් වූ නිකුත්කළ චෙක්පත (අංක: 285648) ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් කර නොතිබිණ.
- ස්ථාවර නියෝග මත ගෙවූ රක්ෂණ වාරිකය රු. 8,500 ක් විය.
- බැංකුව විසින් අයකරනු ලැබූ සේවා ගාස්තු රු. 3,000 ක් විය.

ඔබ විසින් පහත දෑ පිළියෙළ කළ යුතුය:

a . සංශෝධිත මුදල් පාලන ගිණුම

(ලකුණු 05)

b . බැංකු සැසඳුම් ප්‍රකාශය

(ලකුණු 04)

**(මුළු ලකුණු 25)**

**04.** පහත තොරතුරු 2021 අගෝස්තු මාසය සඳහා වරුනි ස්ටෝර්ස් වෙතින් උපුටා ගන්නා ලදී.

- 2021 අගෝස්තු 01 දිනට ශේෂ:

  - ණයගැති පාලන ගිණුම රු.100,000 (හර)

  - ණයහිමි පාලන ගිණුම රු.120,000 (බැර)

  - මුදල් පාලන ගිණුම රු. 150,000 (හර)

  - VAT පාලන ගිණුම රු. 30,000 (බැර)

- 2021 අගෝස්තු මස තුළ සිදුවූ ගනුදෙනුවල සාරාංශය පහත පරිදි වේ.

| අංකය | ගණුදෙනු අයිතමය | රු. |
|---|---|---|
| 1 | ණයට ගැනුම් | 216,000 |
| 2 | ණයට විකුණුම් | 378,000 |
| 3 | අත්පිට මුදලට ගැනුම් | 270,000 |
| 4 | විකුණුම් ආපසු එවුම් | 64,800 |
| 5 | අත්පිට මුදලට විකුණුම් | 162,000 |
| 6 | ගැනුම් ආපසු යැවුම් | 86,400 |
| 7 | රු. 10,000 ක් වට්ටම ලබා දීමෙන් පසුව ණයගතියන්ගෙන් ලැබූ මුදල් | 240,000 |
| 8 | රු. 5,000 ක් වට්ටම ලැබීමෙන් පසුව ණයහිමියන්ට ගෙවූ මුදල් | 175,000 |
| 9 | VAT ගෙවීම | 30,000 |
| 10 | මෙහෙයුම් වියදම් සඳහා ගෙවීම | 27,000 |

අතිරේක තොරතුරු

- ඉහත විකුණුම සහ ගැනුම තුළ 8% ක VAT අන්තර්ගත වේ.
- රු. 12,000 ක ණයගැතියෙක් බුන්වත් වී ඇත. එම මුදල නැවත අයකරගත නොහැකි බවට හඳුනා ගන්නා ලදී.

**ඔබ විසින් පහත දෑ පිළියෙළ කල යුතුය.**

a . විකුණුම් ගිණුම (ලකුණු 02)

b. විකුණුම් ආපසු එවුම් ගිණුම (ලකුණු 01)

c . ගැනුම් ගිණුම (ලකුණු 02)

d . ගැනුම් ආපසු යැවුම් ගිණුම (ලකුණු 01)

e . ණයගැති පාලන ගිණුම (ලකුණු 04)

f . ණයහිමි පාලන ගිණුම (ලකුණු 04)

g . VAT පාලන ගිණුම (ලකුණු 06)

h . මුදල් පාලන ගිණුම (ලකුණු 05)

**(මුළු ලකුණු 25)**

## 05.

i. තේ කර්මාන්තය තුල නිරත වන සීමිත ඇක්වා පොදු සමාගමේ පහත තොරතුරු උපුටා ගන්න ලදී.

2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශයේ සාරාංශය.

| අයිතමය | **Rs. '000** |
|---|---|
| විකුණුම් අදායම | 15,600 |
| විකුණුම් පිරිවැය | 13,100 |
| දළ ලාභය | 2,500 |
| වෙනත් ආදායම් | 230 |
| බෙදාහැරීමේ පිරිවැය | 500 |
| පරිපාලන වියදම් | 380 |
| වෙනත් වියදම් | 110 |

| | |
|---|---:|
| මූල්‍ය වියදම් | 200 |
| බදු පෙර ශුද්ධ ලාභය | 1,540 |
| බදු | 420 |
| කාලච්ඡේදය සඳහා ලාභය | 1,120 |

2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සාරාංශය.

| අයිතමය | **Rs. '000** |
|---|---:|
| **වත්කම්** | |
| දේපල, පිරියත, හා උපකරණ | 18,000 |
| තොගය | 600 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 250 |
| මුදල් හා මුදල් සමාන දෑ | 190 |
| **මුළු වත්කම්** | **19,040** |
| **හිමිකම් හා වගකීම්** | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (කොටසක පොත් අගය රු. 2.00) | 12,000 |
| රඳවා ගත් ඉපයුම් | 1,600 |
| දිගුකාලීන ණය | 5,000 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 340 |
| වෙනත් ජංගම වගකීම් | 100 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | **19,040** |

අතිරේක තොරතුරු

- සමාගම සියලුම විකුණුම් ණය පදනම මත සිදුකරයි.
- 2020 අප්‍රේල් 01 දිනට තොගය රු. 500,000
- 2020 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු දෑ රු. 300,000
- 2021 මාර්තු 31 දිනට කොටසක වෙළෙඳපල මිල රු.8.00

**2021 මාර්තු 31 දිනෙන් අවසන් වර් ෂය සඳහා ඔබ විසින් සීමිත ඇක්වා පොදු සමාගමේ පහත අනුපාත ගණනය කල යුතුය.**

a . දළ ලාභ අනුපාතය

b . ශුද්ධ ලාභ අනුපාතය

c . මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය

d . හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය

e . තොග පිරිවැටුම් අනුපාතය

f . සාමාන්‍ය ණය එකතු කිරීමේ කාලය

g . ණය හිමිකම් අනුපාතය

h . ක්ෂණික වත්කම් අනුපාතය

i . කොටසක ඉපයුම

j . මිල ඉපයුම් අනුපාතය

(ලකුණු 2x10)

ii . 2020 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා කුෂානි ට්‍රේඩර්ස් හි පහත ගිණුම්කරණ දෝෂ හඳුනා ගන්නා ලදී.

1. රු. 160,000 ක විකුණුම් ඉන්වොයිසියක් ගිණුම් පොත් වලින් මගහැරී තිබුණි.

2. දුන් වට්ටම් රු. 13,000 ක්, ලද වට්ටම් ගිණුමට රු. 31,000 ක් ලෙස බැර කර තිබුණි.

3. 2020 ජුනි 01 දින දැරූ රු.80,000 ක යන්ත්‍ර අලුත් වැඩියා වියදම, යන්ත්‍ර ගිණුමට හර කර ඇත. යන්ත්‍ර වාර් ෂිකව 10% බැගින් ක්ෂය කරනු ලැබේ.

**අවශ්‍ය වන්නේ:**

a . ඉහත වැරදි නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ජ'නල් සටහන්.

(ලකුණු 04)

b. අවිනිශ්චිත ගිණුම

(ලකුණු 01)

**(මුළු ලකුණු 25)**

*********************